සීමා නිර්ණය කොමිෂන් සභාව

# எல்லை நிர்ணய ஆணைக்குழு

**DELIMITATION COMMISSION**

කාර්තුමය ප්‍රගති වාර්තාව

**2017 – 1 වැනි කාර්තුව**

காலாண்டு செயலாற்றுகை அறிக்கைகள்

2017 - 1ம் காலாண்டு

# Quarterly Performance Report
# 2017 - 1st Quarter

**ශ්‍රී ලංකා සීමා නිර්ණය කොමිෂන් සභාව**
**2017 ප්‍රථම කාර්තුවේ වාර්තාව**
**( 2017 ජනවාරි 1 සිට මාර්තු 31 දක්වා )**

**පසුබිම**

- වර්තමාන සීමා නිර්ණය කොමිෂන් සභාව පිහිටුවන ලද්දේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජ ව්‍යවස්ථාවේ 41 ආ සහ 95(1) දරණ ව්‍යවස්ථාවන්ට අනුකූලවය. සීමා නිර්ණය කොමිෂන් සභාව ජනාධිපතිවරයා විසින් පත්කරන ලද සභාපති ආචාර්ය කේ.තවලිංගම් මහතා, ආචාර්ය ඒ.ඩී බණ්ඩාරනායක මහත්මිය හා මහාචාර්ය එස්. එච් හස්බුල්ලා මහතා යන සමාජිකයන් තිදෙනාගෙන් සමන්විතය.

- වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සීමා නිර්ණය කොමිෂන් සභාව සඳහා කාර්යභාරයක් පැනවී නැත. මේ අතර ශ්‍රී ලංකාවේ අණපණත් කිපයකින් හා කාර්ය පරිපාටි කිපයකින් ඡන්ද කොට්ඨාශ හා පරිපාලන මට්ටම් වල විවිධ ක්‍රමයේ සීමා නිර්ණය කිරීම් සම්බන්ධයෙන් විධිවිධාන සලස්වා තිබේ. රටේ උපරිම යහපත උදෙසා මෙම විධිවිධාන තර්කානුකුල ලෙස සකස් විය යුතුව තිබේ. නව ව්‍යවස්ථා සංශෝධනයේදී එක් සීමා නිර්ණය කොමිෂන් සභාවක් පමණක් පත්කෙරෙන අතර ඊට පැවරෙන මෙහෙවර යටතේ සියලුම සීමා නිර්ණයන් තර්කානුකුල ලෙස හැඩ ගසන බවට ඉඟියක් ආණ්ඩුක්‍රම ව්‍යවසථා සභාව විසින් ප්‍රකාශකරනු ලැබ තිබේ.

- ගතවූ මාස තුන තුළ ( 2017 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා ) සීමා නිර්ණය කොමිෂන් සභාව තුන් වතාවක් රැස්වූවාය.

  - 2017 ජනවාරි 20
  - 2017 මාර්තු 06
  - 2017 මාර්තු 29

**මාණ්ඩලික කරුණු**

- <u>පරිපාලන නිලධාරි</u> **:** එච්.ඩී.ජයසිරි මහතා 2017.06.01 දින සිට වැඩ භාර ගැනීමට නියමිතය.

- <u>නව වැඩ බලන පත්වීම් - ලේකම්</u> : 2017.03.21 දින සිට වර්ෂයක් සඳහා අතිරේක මැතිවරණ කොමසාරිස් සමන් ශ්‍රී රත්නායක මහතා පත් කරනු ලැබ තිබේ.

- <u>හිටපු වැඩ බලන ලේකම්</u> **:** මෙම තනතුරෙහි කටයුතු කළ අතිරේක මැතිවරණ කොමසාරිස් මැතිවරණ දෙපාර්තුමේන්තුව තුළ තමන්ට ලැබුණු උසස්වීම නිසා සීමා නිර්ණය කොමිෂන් සභාවේ ලේකම් ධූරයෙන් ඉල්ලා අස්විය. ලේකම් වශයෙන් ඔහුගෙන් ඉටු වූ අනගි සේවය කොමිෂන් සභාවේ ඇගයීමට ලක්විය. ඔහුගේ සේවය පිළිබඳ ඇගයීමක් කරමින් ලිපියක් යැවීමට තිරණය කරන ලදි.

- <u>ගණකාධිකාරි තනතුරේ වැඩ බැලීමේ කාල සීමාව දිර්ඝ කිරිම</u> : ගණකාධිකාරි එච්. ඩබ්. එන්. කුමාර මහතාගේ වැඩ බැලිම් සේවා කාලය මාර්තු 31 දින අවසන් විමට නියමිතය. ඔහුගේ සේවය තවත් වසරකින් දිර්ඝ කිරිමට පියවරගෙන තිබේ.

**ආණ්ඩුක්‍රම ව්‍යවසථා සංශෝධනයෙහි උපදෙස් අනුව ගන්නා ලද ක්‍රියා මාර්ග**

ආණ්ඩුක්‍රම ව්‍යවසථා සභාව විසින් දෙන ලද උපදෙස් පරිදි සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු , පළාත් සභා හා පළාත් පාලන සීමා නිර්ණයන් කිරිම සඳහා වූ යෝජනාවක් සකස් කෙරෙමින් පවතී.

**වෙනත් කාර්යන් සම්බන්ධයෙන් ගන්නා ලද පියවර**

පහත දැක්වෙන විෂයයන් යෝජනා කොට ඒවා ක්‍රියාත්මක කිරිම පිළිබඳව සාකච්ඡා කරනු ලැබ තිබේ. අනාගතයේදී ක්‍රියාත්මක කිරිම සඳහා සීමා නිර්ණයට අදාළ වූ තොරතුරු සැලසුම් කිරිම හා එකරැස් කිරිම , ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහණය හා ඉඩම් භාවිතය පිළිබඳ ප්‍රමුඛතා විෂයෙහි ලා පසුගිය සීමා නිර්ණය වාර්තාවන් විශ්ලේෂණය කිරිම.

**සීමා නිර්ණය කොමිෂන් සඳහා පෙර සකස් කරන ලද දැක්ම හා මෙහෙවර නැවත සලකා බැලිම**

මෙම කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලදි.ආයතනයේ මෙම කාරණය පිළිබඳව දැරූ අදහස් උදහස් නව ප්‍රවේශයකින් යුතුව අදට ගැලපෙන අන්දමට නව ප්‍රවේශයකින් යුතුව යලි සලකා බැලිය යුතුය යන්න මෙම කොමිෂන් සභාව නිරික්ෂනය කළාය.සභාපතිවරයාගේ හා සාමාජිකයන්ගේ අදහස් ලබා ගනිමින් මෙම කාරණයෙහිලා නිරත වන ලෙස ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මියට පවරන ලදි.ගත වූ රැස්වීමේදී සාමාජිකයන් විසින් ඒ වනවිට සකස් කර තිබුණ ලියවිල්ල පිළිබඳව අවසන් විමසීමක් කරන ලදි.එම ලියවිල්ල පිළිගත හැකි බවද, දක්වා ඇති අදහස් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිරීක්ෂණය සඳහා ඉදිරිපත් කල යුතු බවද නිරීක්ෂණය විය.

**සීමා නිර්ණය පිළිබඳ සංකල්පනාත්මක අවබෝධය පැහැදිලි කිරීම**

මීට අදාළ වූ කරුණු බොහෝමයක් සාකච්ඡාවට භාජනය කරන ලදි.ශ්‍රී ලංකාවේ පළාත් උප කණ්ඩායම් වලට බෙදීම සඳහා ග්‍රාම නිලධාරී සීමා යලි නිර්ණය කිරීම සඳහා ඉඩම්, සම්පත් හා ජනගහනය පැතිරී ඇති ආකාරය විශ්ලේෂණාත්මකව වර්ග කිරීම අවශ්‍ය බව ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මිය යොජනා කළාය.කමිටුව එම යොජනාව පිළිගත්තේය.

**රාජකාරි හැඳුනුම්පත්**

සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන්ට රාජකාරි හැඳුනුම්පත් ලබා දීමේ ප්‍රයෝජනය ගැන සාකච්ඡා කරන ලදුව එම හැඳුනුම්පත් ලබා දීම සඳහා ක්‍රියා කිරීමට තීරණය කරන ලදි.

**සීමා මායිම් කිරීම හා සංශෝධනයන්ට අදාළ තොරතුරු හා ගැසට් නිවේදන පළාත් පාලන ආයතන වලින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් එක්රැස් කිරීම**

මෙම කාරණයට අදාළ ලියකියවිලි රජයේ එක් ආයතනයකින් හෝ ස්ථානයකින් ලබා ගත නොහැකි නිසා එම තොරතුරු ඒ ඒ පළාත් පාලන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් ලබා ගැනීමට තීරණය කරන ලදි.පළාත් පාලන ආයතන වලින් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් මේ පිළිබඳව විමසා බලන ලදි.සමහර කාර්යාල වලින් සතුටුදායක ප්‍රතිචාර ලැබුණි.අනෙකුත් කාර්යාල වලින්ද එලෙස ප්‍රතිචාර ලැබෙනු ඇතැයි විශ්වාස කරමු.

**සකස් කරන ලද හා ඉදිරිපත් කරන ලද වාර්තා**

- සීමා නිර්ණය කොමිෂන් සභා රැස්වීම් වල වාර්තා සංස්කරණය කරන ලද අතර ඒවා සාකච්ඡාවට භාජනය කරන ලදි.
- කාර්ය සාධන වාර්තා - 4 වැනි කාර්තුව ( 2016 ඔක්තොම්බර් සිට දෙසැම්බර් දක්වා ) පිළිබඳ කාර්ය සාධන වාර්තාව සංස්කරණය කොට සාකච්ඡාවට භාජනය කරන ලදි.
- 2016 වර්ෂයේ 1 සිට 4 දක්වා කාර්තුවල වාර්තා පදනම් කොට ගෙන වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කිරිමට ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක මහත්මිය එකඟ වූවාය. 2016 වර්ෂය සඳහා වූ අවසාන ගිණුම් හා 2017 අයවැය යෝජනා මෙම වාර්තාවේ ඇතුලත් කරනු ලැබේ.

**සම්පත් කේන්ද්‍රය**

සීමා නිර්ණ විෂය පිළිබඳ එකඟතාව හා රාජ්‍ය නිළධාරීන් තුළ ඇති දැනුම අභිවර්ධනය කිරීම සඳහා ඊට අදාළ ලිපි ලේඛණ හා තොරතුරු එක් රැස් කිරීමට සම්පත් කේන්ද්‍රයක් පිහිටුවීමට සීමා නිර්ණය කොමිෂන් සභාව තීරණය කළාය. මේ සඳහා අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත.